පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(1) අන්තර්ජාලය යනු කුමක්ද?

(2) අන්තර්ජාලයට සම්බන්ධ වීම සඳහා ඔබට යොදා ගත හැකි වෙබ් අතිරික්සු 5 ක් ලියන්න.

(3) ඔබ දන්නා සෙවුම් යන්ත්‍ර 5 ක් ලියන්න.

(4) අන්තර්ජාලය මගින් ඔබට ලබා ගත හැකි සේවාවන් 5 ක් ලියන්න.

(5) වෙබ් අතිරික්සුවක් හා සෙවුම් යන්ත්‍රයක් අතර පවතින වෙනස්කම් මොනවාද?

(6) ඔබ දන්නා අධ්‍යාපනික වෙබ් අඩවි 5 ක් ලියා දක්වන්න


(7) ඔබගේ පරිගණකය තුල පවතින දත්ත ආරක්ෂා කර ගැනීම සඳහා ඔබට ගත හැකි ක්‍රියාමාර්ග 2 ක් ලියන්න

(8) අනුපිළිවෙලට ගලපා ලියන්න.

(a) සංදර්ශකය ක්‍රියා විරහිත කිරීම.
(b) නිර්බාධක ජව සැපයුම (UPS) ක්‍රියා විරහිත කිරීම.
(c) විදුලි බලය සැපයූ ස්විචය ක්‍රියා විරහිත කිරීම.
(d) කටයුතු කරමින් සිටි වැඩසටහනින් ඉවත් වීම.
(e) වසා දැමීමේ (Shut Down) විධානය තේරීම.

9 මෙහෙයුම් පද්ධති සඳහා භාවිතා වන වෙළඳ ලාංඡන කිහිපයක් පහත දැක්වේ. A,B,C හා D හිස්තැන් සඳහා සුදුසු මෙහෙයුම් පද්ධති නාමය වරහන් තුලින් තෝරා ලියන්න.

(Apple, Linux, Windows,Android)



A………………..…………… B…………………………… C…………………………… D……………………………

(10) යා කරන්න.

| A තීරුව | B තීරුව |
|---|---|
| චිත්‍රක මෘදුකාංගයක් සඳහා උදාහරණයකි. | ගිනි නිවන උපකරණ පිළිබඳ දැනුවත් වීම. |
| 3R සංකල්පයට අයත් වන්නේ, | පාවහන් ගලවා විද්‍යාගරයට ඇතුළු වීම. |
| පරිගණක විද්‍යාගාරය තුළ ඔබගේ ආරක්ෂාවට කල යුතු වන්නේ, | Microsoft Paint |
| පරිගණක විද්‍යාගාරය තුළ උපාංග වල ආරක්ෂාවට කල යුතු වන්නේ, | WordPerfect |
| වදන් සැකසුම් මෘදුකාංගයකි. | ප්‍රතිචක්‍රීකරණය. |